ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව

වාර්ෂික වාර්තාව

2014

தேசிய கல்வி ஆணைக்குழு

வருடாந்த அறிக்கை

2014

National Education Commission

Annual Report

2014

නො. 126, නාවල පාර, නුගේගොඩ - 126 எனும், முகவரியில் அமைந்துள்ளது - No.126, Nawala Road, Nugegoda

පටුන		අංකය
1.	හැඳින්වීම	02
2.	කාර්යයන් හා කර්තව්‍යයන්	04
3.	කොමිෂන් සභාවේ සංයුතිය	05
4.	ඉලක්ක හා කාර්ය සාධන දර්ශක	06
5.	කාර්ය සාධන සාරාංශය - 2014	07
6.	අයවැය ප්‍රතිපාදන හා මූල්‍ය ප්‍රගතිය - 2014	13
7.	ඇමුණුම්	
	ඇමුණුම I - ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම - 2014	14
	ඇමුණුම II - විසර්ජන ගිණුම - 2014	15
	ඇමුණුම III - කොමිෂන් සභාවේ සාමාජිකයින්ගේ තොරතුරු	16
	ඇමුණුම IV - විගණකාධිපති වාර්තාව - 2014	17
	ඇමුණුම V - ආයතනික ව්‍යුහය	32

හැඳින්වීම

1991 අංක 19 දරණ ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනත මගින් ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව ස්ථාපිත කරන ලද්දේ අධ්‍යාපන ප්‍රතිපත්ති සහ සැලසුම් වහා සමාලෝචනය කිරීම සහ පෘථුල ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියක් සම්බන්ධයෙන් ජනාධිපතිවරයා වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම ද ඇතුළුව අධ්‍යාපන ප්‍රතිපත්ති නොකඩවා පවත්වාගෙන යාම සහතික කිරීම සහ සමාජයේ වෙනස්වන අවශ්‍යතාවන්ට අධ්‍යාපන ක්‍රමය අනුකූලතාව දැක්වීමේ අදහස ඇතිව අධ්‍යාපන ප්‍රතිපත්තියේ සියලු අංශ සම්බන්ධයෙන් ජනාධිපතිවරයා වෙත නිර්දේශ ඉදිරිපත් කිරීමේ අභිලාෂයෙනි.

මෙහි පළමුවන කොමිෂන් සභාව 1991-1996 කාලපරිච්ඡේදය සඳහා පත් කරනු ලැබීය. දෙවන කොමිෂන් සභාව 1996 ඔක්තෝම්බර් 01 වන දින සිට 2001 සැප්තැම්බර් 30 වන දින තෙක් ක්‍රියාත්මක විය. තෙවන කොමිෂන් සභාව 2001 ඔක්තෝම්බර් 01 දින සිට 2004 මැයි 30 දක්වා ක්‍රියාත්මක විය. හතරවන කොමිෂන් සභාව 2004 ජූලි 01 සිට 2006 මාර්තු වන තෙක් ක්‍රියාත්මක විය. පස්වන කොමිෂන් සභාව 2006 අප්‍රේල් 10 සිට සිය කටයුතු ආරම්භ කරන ලද අතර එහි නිල කාලය 2011 වර්ෂයේ අප්‍රේල් 09 දිනෙන් අවසන් විය. හයවන කොමිෂන් සභාව ස්වකීය ප්‍රථම කොමිෂන් සභා රැස්වීම 2012 නොවැම්බර් 20 දින පවත්වමින් තම නිල කටයුතු ආරම්භ කරන ලදී.

දැක්ම

ශ්‍රී ලාංකේය අනන්‍යතාව සුරක්ෂිත කෙරෙන්නාවූත් සියළු අභියෝගයන්ට මුහුණ දීම සඳහා යොදා ගත හැකි බව සහ සාධාරණත්වය සහතික කෙරෙන්නාවූත් පරිපූර්ණ අධ්‍යාපනයක් සැමට ලබාදෙන පෘථුල ජාතික ප්‍රතිපත්ති රාමුවක් නිර්මාණය කිරීම.

මෙහෙවර

අධ්‍යාපන පද්ධතියේ සියළු අංශ නොකඩවා පවත්වාගෙන යාම සහතික කෙරෙන්නාවූත් ශ්‍රී ලංකාවේ වෙනස් වන අවශ්‍යතාවන්ට අනුකූලතාව දැක්වීමේ හැකියාව ඇත්තාවූත් ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති සාකච්ඡා කිරීම හා නිර්දේශ ඉදිරිපත් කිරීම.

කාර්යයන් හා කර්තව්‍යයන්

ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති පිළිබඳව අතිගරු ජනාධිපතිතුමා වෙත නිර්දේශ ඉදිරිපත් කිරීමේ අරමුණින් 1991 අංක 19 දරන ජාතික අධ්‍යාපන කොමිෂන් සභා පනතින් පිහිටුවනු ලැබූ ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව මඟින් ප්‍රධාන වශයෙන් ඉටු කරනු ලබන කාර්යයන් පහත දැක්වේ.

(අ) අධ්‍යාපන ප්‍රතිපත්තිය සහ සැලසුම් වහා සමාලෝචනය කිරීම සහ පෘථුල ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියක් සම්බන්ධයෙන් ජනාධිපතිවරයා වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම ද ඇතුළුව, අධ්‍යාපන ප්‍රතිපත්ති නොකඩවා පවත්වා ගෙන යාම සහතික කිරීමේ සහ සමාජයේ වෙනස්වන අවශ්‍යතාවන්ට අධ්‍යාපන ක්‍රමය අනුකූලවීම පිණිස, අධ්‍යාපන ප්‍රතිපත්තියේ සියලු ම අංශ සම්බන්ධයෙන් ජනාධිපතිවරයා වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම;

(ආ) ක්‍රියාත්මක වෙමින් පවතින ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තිය සහ සැලස්ම හෝ සැලසුම් කලින් කල සමාලෝචනය කිරීම සහ විශ්ලේෂණය කිරීම ද අවශ්‍ය විටක එම ප්‍රතිපත්තියේ, සැලැස්මේ හෝ සැලසුම්වල ඇති කළ යුතු වෙනස්කම් ජනාධිපතිවරයා වෙත නිර්දේශ කිරීම;

(ඇ) කොමිෂන් සභාවේ උපදෙස් සඳහා ජනාධිපතිවරයා විසින් කොමිෂන් සභාව වෙත යොමු කරනු ලැබිය හැකි, අධ්‍යාපනයට අදාළ සියලු කාරණා සම්බන්ධයෙන් ජනාධිපතිවරයා වෙත උපදෙස් දීම.

කොමිෂන් සභාවේ සංයුතිය:

(අ) 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතින් පිහිටුවන ලද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිවරයා;

(ආ) 1990 අංක 20 දරණ තෘතියික හා වෘත්තීය අධ්‍යාපන පනතින් පිහිටුවන ලද තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ සභාපතිවරයා;

(ඇ) අධ්‍යාපන හා උසස් අධ්‍යාපන විෂයය භාර අමාත්‍යවරයාගේ නිර්දේශය මත, ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයෙක්;

(ඈ) මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ නිර්දේශය මත, ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයෙක්;

(ඉ) පළාත් සභා විෂයය භාර අමාත්‍යවරයාගේ නිර්දේශය මත, ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයෙක්;

(ඊ) අධ්‍යාපනය, පරිපාලනය හෝ කළමනාකරණය යන ක්ෂේත්‍රවල නිපුණතා දක්වා ඇත්තා වූ හෝ යම් වෘත්තියක විශිෂ්ටත්වයක් ලබා ඇත්තා වූ තැනැත්තන් අතුරින් ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන වෙනත් සාමාජිකයන් දහ දෙනෙක්. 5 වන වගන්තිය යටතේ පත් කරනු ලබන සභාපතිවරයා, උප සභාපතිවරයා (ප්‍රතිපත්ති) සහ උප සභාපතිවරයා (සැලසුම්) කොමිෂන් සභාවේ පූර්ණකාලීන සමාජිකත්වය දරති.

එසේ වුවද, 2004 වර්ෂයේ පටන් සැහෙන කාලයක් එක් උප සභාපතිවරයෙකු විසින් ඉහත උප සභාපති තනතුරු දෙකම (ප්‍රතිපත්ති හා සැලසුම්) ආවරණය කරනු ලැබීය.

මෙම කොමිෂන් සභාව, නුගේගොඩ, නාවල පාරේ අංක: 126 දරන ස්ථානයේ පිහිටා ඇත. ජනාධිපතිතුමා විසින් පත් කරනු ලබන කොමිෂන් සභාවේ ලේකම්, පරිපාලන කටයුතු භාරව ක්‍රියා කරයි. දැනට කොමිෂන් සභාවේ ස්ථිර කාර්ය මණ්ඩලය 32 දෙනෙකුගෙන් සමන්විතය.

ඉලක්ක හා කාර්ය සාධන දර්ශක

	ක්‍රියාකාරකම	අරමුණු	කාර්ය සාධන දර්ශක
01	සාමාන්‍ය අධ්‍යාපනය සඳහා වූ ප්‍රතිපත්ති යෝජනාවලියක් සැකසීම.	සාමාන්‍ය අධ්‍යාපනය සඳහා ප්‍රතිපත්ති යෝජනාවලියක් සම්පාදනය කිරීමට දායකවීම.	සාමාන්‍ය අධ්‍යාපනය සඳහා වූ ප්‍රතිපත්ති ප්‍රකාශනය (භාෂා මාධ්‍ය 03 න්ම) සැකසීම.
02	3 වර්ගයේ පාසල්වල තොරතුරු අඩංගු දත්ත පාදයක් සකස් කිරීම	ශ්‍රී ලංකාවේ 3 වන වර්ගයේ පාසල්වල භෞතික හා මානව සම්පත් පිළිබඳ තොරතුරු, මූල්‍ය සම්පත් පිළිබඳ තොරතුරු, මූල්‍ය තොරතුරු, ඉගෙනුම් ක්‍රමවේදය ඇතුලත් වන පරිදි දත්ත සහ තොරතුරු ඇතුළත් දත්ත පද්ධතියක් නිර්මාණය කිරීම.	බස්නාහිර පලාත් අවසන් වාර්තාව සැකසීම
03	ජාතික අධ්‍යාපන විද්‍යා පීඨවලට ගුරු සිසුන් බඳවා ගැනීමේ ප්‍රතිපත්තිය හා එහිදී සලකා බැලෙන නිර්ණායක පිළිබඳ අධ්‍යයනය	පද්ධතිය තුළ ගැටළු අවම කිරීම සඳහා ගුරුවරුන් බඳවා ගැනීම් හා යෙදවීම කෙරෙහි බලපාන සාධක හඳුනා ගැනීම.	නිර්දේශ සහිත අවසන් වාර්තාව සැකසීම.
04	උසස් අධ්‍යාපනය පිළිබඳ ප්‍රතිපත්ති යෝජනා සකස් කිරීම	උසස් අධ්‍යාපනය සඳහා ප්‍රතිපත්ති යෝජනාවලියක් සම්පාදනය කිරීමට දායකවීම.	උසස් අධ්‍යාපනය සඳහා වූ ප්‍රතිපත්ති ප්‍රකාශනය (භාෂා මාධ්‍ය 03 න්ම) සැකසීම.
05	තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපනයට අදාළ ප්‍රතිපත්ති යෝජනාවලියක් සැකසීම	තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපනය සඳහා ප්‍රතිපත්ති යෝජනාවලියක් සම්පාදනය කිරීමට දායකවීම.	තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපනය සඳහා වූ ප්‍රතිපත්ති ප්‍රකාශනය (භාෂා මාධ්‍ය 03 න්ම) සැකසීම.
06	අ.පො.ස. (උ.පෙළ) තාක්ෂණවේදය විෂය ධාරාව ක්‍රියාත්මක වීම පිළිබඳ අධ්‍යයනය	මෙම විෂය ධාරාව පාසල් පද්ධතිය තුළ ක්‍රියාත්මක වන ආකාරය හා එය ක්‍රියාත්මක කිරීමේ දී ඇතිවන ගැටළු හා බාධක පිළිබඳ අධ්‍යයනය කිරීම.	නිර්දේශ සහිත අවසන් වාර්තාව සැකසීම.
07	සිංහල භාෂාව භාවිතය හා ප්‍රමිතිකරණය පිළිබඳ අධ්‍යයනය	සිංහල භාෂාව භාවිතය පිළිබඳ ප්‍රමිතිකරණය කිරීම.	නිර්දේශ සහිත වාර්තාව සැකසීම.

කාර්ය සාධන සාරාංශය - 2014

හැඳින්වීම

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව වෙත නෛතිකව පැවරී ඇති ප්‍රධාන කාර්ය භාරය පහත සඳහන් පරිදි මූලික අංශ තුනක් යටතේ විභේදනය කළ හැකිය.

1. සැලසුම් සමාලෝචන හා විශ්ලේෂණය තුළින් දේශයේ අධ්‍යාපන ප්‍රතිපත්ති විවරණය
2. කාලීන අවශ්‍යතාවයන්ට අනුරූපී වන ලෙස පවත්නා අධ්‍යාපන ප්‍රතිපත්ති යෝජනා නව්‍යකරණය
3. උක්ත සමාලෝචන, විශ්ලේෂණ, විවරණ, නව්‍යකරණ සියල්ල පසුබිම් කොට ගෙන දේශයට ප්‍රශස්ත අධ්‍යාපන ප්‍රතිපත්ති ජනාධිපතිවරයාට නිර්දේශ කිරීම.

උක්ත කාර්යයන් සපුරාලීම පිණිස ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පහත සඳහන් ප්‍රධාන විෂය ක්ෂේත්‍ර තුන යටතේ ස්ථාවර කමිටු 3ක් ස්ථාපනය කරනු ලැබ තිබේ.

1. සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ ස්ථාවර කමිටුව
2. උසස් අධ්‍යාපනය පිළිබඳ ස්ථාවර කමිටුව
3. තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපනය පිළිබඳ ස්ථාවර කමිටුව

එක් එක් ක්ෂේත්‍රයෙහි විශේෂඥ දැනුම සහිත ප්‍රවීණයන්, හසල අත්දැකීම් ඇති වෘත්තිකයින් සහ අදාළ ක්ෂේත්‍රයේ විවිධ කුසලතා ප්‍රකට කර ඇති පෞද්ගලික අංශයේ විද්වතුන් ප්‍රමුඛ පාර්ශවකරුවන් 15-20 ක් අතර සංඛ්‍යාවකින් මෙම ස්ථාවර කමිටු තුන සමන්විත වේ.

ජාතික අධ්‍යාපන කොමිෂන් සභා සාමාජිකයින්ගේ ද ඉහත දැක්වූ ස්ථාවර කමිටු සාමාජිකයන්ගේ හා ජාතික අධ්‍යාපන කොමිෂන් සභා කාර්ය මණ්ඩලයේ විශේෂඥ දැනුම හා අත්දැකීම් භාවිත කරමින් 2014 වර්ෂය තුළ ඉටු කිරීමට සැලසුම් කරන ලද ක්‍රියාකාරකම්හි කාර්ය සාධනය පහත සඳහන් පරිදි සාරාංශ ගත කළ හැකිය.

1. සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ කාර්ය සාධනය

1.1 සාමාන්‍ය අධ්‍යාපනය සඳහා වූ ප්‍රතිපත්ති යෝජනාවලියක් සැකසීම.

සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ ජාතික ප්‍රතිපත්ති යෝජනා සඳහා පාදක කරගැනීම පිණිස එහි සියළුම අංග ආවරණය වන පරිදි ක්ෂේත්‍ර 10 ක් යටතේ පර්යේෂණ අධ්‍යයනයන්හි නිරත වීම 2013 වර්ෂයේ අවසාන හා 2014 වර්ෂයේ මුල් කාර්තුව තුළදී සිදු කරන ලදී. මෙම පර්යේෂණ අධ්‍යයනයන් 10 මඟින් අනාවරණය වූ කරුණු පිළිබඳ අදහස් හා යෝජනා ලබා ගැනීම සඳහා වැඩමුළුවක් අධ්‍යාපන අමාත්‍යාංශයේ අධ්‍යක්ෂකවරුන් පළාත් හා කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකවරු, ජාතික අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්, අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්, විෂය අධ්‍යක්ෂවරුන්, විභාග කොමසාරිස් ජනරාල් හා කොමසාරිස්වරු, ජාතික අධ්‍යාපන විද්‍යා පීඨයන්හි පීඨාධිපති,

උපපීඨාධිපතිවරුන් සහ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් හා පාසල් වල විදුහල්පතිවරු, ගුරුවරුන් ආදී විද්වතුන්ගේ සහභාගීත්වයෙන් 2014 ජුනි මස පැවැත්විණි.

ප්‍රතිපත්තිමය යෝජනා කෙටුම්පත සකස් කිරීමේ නේවාසික වැඩමුළුවක් 2014 අගෝස්තු මස,28 29 දෙදින ලෝක බැංකුවේ දැනුම් පාදක වන්නා වූ පාසල් අධ්‍යාපන පද්ධතිය පරිනාමනය කිරීමේ ව්‍යාපෘතියේ TSEP – Transforming School Education System as he Foundation of a Knowledge Hub Project ආධාර මත සිදු කරන ලදී.

සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ ප්‍රතිපත්ති කෙටුම්පත් යෝජනාවලිය 2014 වර්ෂාවසානය වන විට සකසා අවසන් කර කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීමට නොහැකිවිය.

1.2 3 වර්ගයේ පාසල්වල තොරතුරු අඩංගු දත්ත පාදයක් සකස් කිරීම

බස්නාහිර පලාතේ සියළුම 3 වර්ගයේ පාසල් වෙතින් අදාළ තොරතුරු වර්ෂයේ මුල් කාර්තුව තුළ දී ලබාගන්නා ලදී. එම තොරතුරු දත්ත පාදයකට සුදුසු පරිදි විශ්ලේෂණය කරන ලදී.

මුල් කාර්තුව තුළ බස්නාහිර පලාතට අදාළ තොරතුරු රැස් කරන ලද අතර දෙවන කාර්තුව වන විට වයඹ පලාතේ තෝරා ගත් ගුරු උපදේශක මහත්ම මහත්මීන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී. ඒ දැනුම වයඹ පළාතේ සියළුම 3 වර්ගයේ පාසල් වල තොරතුරු රැස් කරන ලදී.

2014 වර්ෂයේ තෙවන කාර්තුවේදී සබරගමුව පලාතේ තෝරාගත් ගුරු උපදේශක මහත්ම මහත්මීන් දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වා එම පලාතේ 3 වර්ගයේ පාසල් වල තොරතුරු ද 2014 වර්ෂය අවසානය වන විට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව වෙත ලබාගන්නා ලදී.

2014 වර්ෂය අවසාන වන විට මෙම පලාත් 3 හි (වයඹ, බස්නාහිර, සබරගමු) දත්ත ජාතික අධ්‍යාපන කොමිෂන් සභා කාර්ය මණ්ඩලය විසින් විශ්ලේෂණය කරන ලදී.

1.3 ජාතික අධ්‍යාපන විද්‍යා පීඨවලට ගුරු සිසුන් බඳවා ගැනීමේ ප්‍රතිපත්තිය හා එහිදී සලකා බැලෙන නිර්ණායක පිළිබඳ අධ්‍යයනය

දක්ෂ නිර්මාණශීලී හා කාර්යක්ෂම ගුරුවරයෙකු බිහි කිරීම උදෙසා ස්ථාපිත කරන ලද ජාතික අධ්‍යාපන විද්‍යා පීඨ ආරම්භයේ දී ඉතාමත් ඵලදායී හා විධිමත් ලෙස ක්‍රියාත්මක වුවද වර්තමානය වනවිට ඒවායේ කටයුතු තරමක් දුරට ව්‍යාකූල තත්වයක පවතින බවට නිරීක්ෂණය වී ඇත. තව ද, මෙම ආයතනය සඳහා ගුරු සිසුන් තෝරා ගැනීමේ පටිපාටිය ආරම්භයේ දී වූ ප්‍රතිපත්තියෙන් බැහැරව වෙනස් වීම් වලට භාජනය වී ඇත. ගුරු සිසුන් බඳවා ගැනීමේ දී පාසල් පද්ධතියේ ඇති ගුරු අවශ්‍යතා පිළිබඳව නියමාකාරයෙන් සැලකිල්ලට ගනු ලබන්නේ ද යන්න ගැටළු සහගතය. එසේම, එම ප්‍රතිපත්ති හා අදාළ නිර්ණායක වත්මන් සමාජයට යථාර්තවාදීව ගැලපෙන්නේ ද යන්න තවත් ගැටළුවකි. මෙම කරුණු පිළිබඳව සලකා බලා ජාතික අධ්‍යාපන විද්‍යා පීඨවලට ගුරු සිසුන් බඳවා ගැනීමේ ප්‍රතිපත්තිය හා එහිදී සලකා බැලෙන

නිර්ණායක පිළිබඳව අධ්‍යයනය කොට, ගුරු සිසුන් තෝරා ගැනීමේ යථාර්තවාදී හා විධිමත් ක්‍රමවේදයක් හඳුන්වාදීම යුගයේ අවශ්‍යතාවයක් බව ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් හඳුනාගත් බැවින් මෙම අධ්‍යයනය ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් සිදු කරනු ලැබීය.

මේ සඳහා අධ්‍යාපන විද්‍යාපීඨවල පරිපාලන හා කළමනාකරණ කටයුතු සිදු කළ අධ්‍යාපන අමාත්‍යාංශයේ සේවය කරන ලද නිලධාරීන් සහ විද්වතුන් සමග අධ්‍යාපන විද්‍ය පීඨවලට බඳවා ගැනීමේ මූලික ප්‍රතිපත්තියට අදාළව සාකච්ඡාවක් 2014 වර්ෂය මුල් කාර්තුව තුළදී සිදුවිය.

එමෙන්ම, විද්‍යා පීඨ හා සම්බන්ධ දත්ත ලබාගැනීම සඳහා පොදු කරුණු ඇතුළත් ප්‍රශ්නාවලියක් සෑම අධ්‍යාපන විද්‍යා පීඨයකටම ලබා දී තැපැල් මගින් ප්‍රතිචාර ලබාගැනීමට අමතරව ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ සභාපති, උප සභාපති, ලේකම් ඇතුළු අධ්‍යාපන කාර්ය මණ්ඩලයේ සාමාජිකයන් විසින් ක්ෂේත්‍ර අධ්‍යයනය සඳහා පස්දුන්රට ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය, සියනෑ ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය, අඩ්ඩාලච්චේන ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය හා ශ්‍රීපාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය තෝරා ගෙන පීඨාධිපති, උප පීඨාධිපති, ලේඛකාධිකාරී, කථිකාචාර්යවරුන් හා ශිෂ්‍යයන් වෙතින් තොරතුරු 2014 වර්ෂයේ මැද භාගය වනවිට රැස් කරන ලදී.

2014 වර්ෂය අවසන් වනවිට රැස් කරන ලද තොරතුරු ජාතික අධ්‍යාපන කොමිෂන් සභා කාර්ය මණ්ඩලය විසින් විශ්ලේෂණය කිරීමෙහි නිරතව සිටින ලදී.

2. උසස් අධ්‍යාපනය පිළිබඳ කාර්ය සාධනය

2.1 උසස් අධ්‍යාපනය පිළිබඳ ප්‍රතිපත්ති යෝජනා යෝජනා සකස් කිරීම

2013 වර්ෂයේ දී පැවති කමිටු රැස්වීම් වලට සමගාමීව ජාතික අධ්‍යාපන කොමිෂන් සභා සාමාජිකයින්, ස්ථාවර කමිටු සාමාජිකයින් කිහිපදෙනෙකු සහ ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ සභාපති, උපසභාපති ඇතුළු අධ්‍යයන හා පර්යේෂණ අංශයේ නිලධාරින් සහභාගී වූ ක්ෂේත්‍ර චාරිකා/ නිරීක්ෂණ මගින් පර්යේෂණ අධ්‍යයන වලට අමතරව මෙම වසරේදී නැගෙනහිර විශ්වවිද්‍යාලයෙහි, අධ්‍යයන හා අනධ්‍යන කාර්යමණ්ඩල, පරිපාලන කාර්ය මණ්ඩලය හා ශිෂ්‍ය ශිෂ්‍යාවන් උපකුලක වශයෙන් නියෝජනය කෙරෙන පරිදි කණ්ඩායම් සමඟ ව්‍යුහගත සාකච්ඡාවක් පැවැත්වීම තුළින් ප්‍රතිපත්තිමය වශයෙන් වැදගත් තොරතුරු එක් රැස් කෙරිණි.

එමගින් අනාවරණය වූ කරුණු හා විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ප්‍රතිපත්ති සකස් කිරිමට මූලික වන්නා වූ කරුණු සාකච්ඡා කිරීම සඳහා ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව මඟින් සංවිධානය කරන ලද ආරම්භක වැඩමුළුවක් 2014 ඔක්තෝබර් මස 24 වන දින ශ්‍රී ලංකා පදනම් ආයතනයේදී පවත්වන ලදී. මෙම වැඩමුළුවට විශ්වවිද්‍යාල උප කුලපතිවරු, මහාචාර්යවරු, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරු, පීඨාධිපතිවරු, අධ්‍යාපනඥයන්, රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතනවල විවිධ ක්ෂේත්‍රයන්හි වෘත්තිකයන් හා අමාත්‍යාංශ නිලධාරිහු සහභාගී වූහ.

මෙහිදී අනාවරණය වූ කරුණු අනුව හඳුනාගත් විෂය ක්ෂේත්‍ර 8 ක් යටතේ උසස් අධ්‍යාපනය සඳහා ප්‍රතිපත්ති යෝජනාවලිය සකස් කළ යුතු බවට තීරණය විය. ඒ එක් එක් විෂය ක්ෂේත්‍රය අධ්‍යයනය කර පර්යේෂණ අධ්‍යයනයක් බැගින් ඉදිරිපත් කිරීම සඳහා විෂය ප්‍රවීණයන්ගෙන් සමන්විත පර්යේෂණ කණ්ඩායම් එක් එක් ක්ෂේත්‍රය සඳහා තෝරා පත් කර ගන්නා ලදී. තීරණය කරන ලද විෂය ක්ෂේත්‍ර 8 පහත පරිදි වේ.

- විශ්වවිද්‍යාලවලට ඇතුලත් වීම හා අනෙකුත් මූලධර්ම
- ඊළඟ දශකය සඳහා විෂය ඉල්ලුම හඳුනා ගැනීම
- පශ්චාද් උපාධි අධ්‍යාපනය
- කාර්ය මණ්ඩල ධාරිතා සංවර්ධනය (අධ්‍යයන හා අනධ්‍යයන)
- උසස් අධ්‍යාපනයට ප්‍රවේශ වීම පුළුල් කිරීම හා කළමනාකරණය, උසස් අධ්‍යාපනයට සම්බන්ධිත පර්යේෂණ
- ශිෂ්‍ය හා කාර්යමණ්ඩල විනය
- වෘත්තීය මාර්ගෝපදේශනය හා ප්‍රගමනය
- ගුණාත්මකභාවය සහතික කිරීම හා ප්‍රමිතිකරණය

2014 දෙසැම්බර් 24,28 දෙදින පුවත්පත් දැන්වීම් පළකිරීමෙන් හා ශ්‍රී ලංකාවේ සියළුම විශ්වවිද්‍යාල වල ප්‍රදර්ශනය කිරීම මගින් මෙම ක්ෂේත්‍ර 8 සඳහා විද්වතුන්ගේ සහ මහජන අදහස් හා යෝජනා කැඳවීම සිදු කරන ලදී.

රැස්කරගන්නා ලද තොරතුරු හා ප්‍රතිපත්ති යෝජනා පිළිබඳ විමර්ශනය කොට නිගමනයන්ට එළඹීම සඳහා අවශ්‍ය කටයුතු 2014 වර්ෂය අවසාන වන විට ජාතික අධ්‍යාපන කොමිෂන් සභා කාර්ය මණ්ඩලය විසින් සිදු කරන ලදී.

3. තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපනය පිළිබඳ කාර්ය සාධනය

3.1 තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපනයට අදාළ ප්‍රතිපත්ති යෝජනාවලියක් සැකසීම

2013 වර්ෂයේදී සකස් කරන ලද මාර්ග සැලැස්ම - අනුව තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපනයට අදාල ජාතික ප්‍රතිපත්ති රාමුව පහත සඳහන් විෂය ක්ෂේත්‍ර සම්බන්ධයෙන් සකස් කල යුතු බවට තීරණය විය.

- තාක්ෂණික අධ්‍යාපන සංකල්පය
- තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපනයේ විවිධත්වය
- තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපනය සහ පුහුණුව යන ක්ෂේත්‍රයෙහි ඇති බාධා සහ දුර්වලතාවයන්
- වෘත්තීය මාර්ගෝපදේශනය සහ උපදේශනය
- දේශීය තත්ත්ව සහතික ආයතන ඔස්සේ ක්‍රියාත්මක කෙරෙන වැඩසටහන්වල ගුණාත්මකභාවය

- සාමාන්‍ය, උසස්, වෘත්තීය හා තාක්ෂණ අධ්‍යාපන ක්ෂේත්‍රයන් අතර පවතින අන්‍යොන්‍ය සහසම්බන්ධතා
- වෘත්තීය ආයතන, ජාත්‍යන්තර සුදුසුකම් පිරිනමන ආයතන, ජාත්‍යන්තර තත්ත්ව සහතික පිරිනමන ආයතන, රාජ්‍ය හා පෞද්ගලික අංශයන්හි පුහුණු කටයුතු

3.2 අ.පො.ස. (උ.පෙළ) තාක්ෂණවේදය විෂය ධාරාව ක්‍රියාත්මක වීම පිළිබඳ අධ්‍යයනය

සාමාන්‍ය අධ්‍යාපන පද්ධතිය සඳහා තාක්ෂණවේදය විෂය ධාරාව හඳුන්වාදීම අධ්‍යාපනයේ සුවිශේෂී හැරවුම් ලක්ෂ්‍යයක් විය. පසුගිය දශකය තුළ තාක්ෂණික හා සේවා අංශයේ වර්ධනය,නාවික, ගුවන්, වාණිජ, බලශක්ති හා දැනුම කේන්ද්‍රීය මානව සම්පත් සංවර්ධනය සඳහා වූ රජයේ සංවර්ධන සැලසුමට ගැලපෙන පරිදි පාසල් පද්ධතියට තාක්ෂණවේදය විෂය ධාරාව හඳුන්වා දීම සිදු විය.

අධ්‍යාපන අමාත්‍යාංශය විසින් 2013 වර්ෂයේ දී දීප ව්‍යාප්තව පාසල් 250ක් සඳහා මෙම විෂය ධාරාව ප්‍රථමයෙන් හඳුන්වාදීම සිදු කරන ලදී. ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් මෙම විෂය ධාරාව පාසල් පද්ධතිය තුළ ක්‍රියාත්මක වන ආකාරය හා එය ක්‍රියාත්මක කිරීමේ දී ඇතිවන ගැටළු හා බාධක පිළිබඳ අධ්‍යයනය කොට එය සාර්ථකව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කරන ලදී.

මෙම වර්ෂයේ දෙවන කාර්තුවේ දී පළාත් 3ක (බස්නාහිර, දකුණ, සබරගමුව) තෝරා ගත් පාසල් 25ක් අධ්‍යයනය කර අවශ්‍ය තොරතුරු රැස්කිරීම සිදු කරන ලදී.

2014 වර්ෂය අවසානය වන විටත් ජාතික අධ්‍යාපන කොමිෂන් සභා කාර්ය මණ්ඩලය දත්ත විශ්ලේෂණය කිරීමෙහි නියැළෙමින් සිටියහ.

4. ජනාධිපති ලේකම් කාර්යාලය වෙත සම්පාදනය කෙරුණු වාර්තා

සිංහල භාෂාව භාවිතය හා ප්‍රමිතිකරණය පිළිබඳ අධ්‍යයනය

ඉහත දැක් වූ කාර්යයන්ට අමතරව ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව වෙත විශේෂයෙන් අධ්‍යයනය කර වාර්තා කළ යුතු ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තීන්ට අදාළ කාර්ය භාරයන් ද ජනාධිපති ලේකම් කාර්යාලය හා අමාත්‍ය මණ්ඩල කාර්යාලය විසින් වරින් වර පැවරිණි.

ඒ අතරින් "සිංහල අක්ෂර ලේඛණය හා භාෂා ප්‍රයෝග විධි පිළිබඳ ප්‍රමිතිය" සම්බන්ධ අධ්‍යයනය ප්‍රමුඛ වේ.

ඒ අනුව, 2014 වර්ෂයේදී සිංහල භාෂාව භාවිතය හා ප්‍රමිතිකරණය කිරීම පිළිබඳ විද්වත් මණ්ඩලය සමඟ මූලික සාකච්ඡා වට කිහිපයක් පවත්වා පරිච්ඡේද 10 කින් සමන්විත කෙටුම්පත් වාර්තාවක් සකස් කරන ලදී. 2014 වර්ෂය අවසාන වන විට මූලික කෙටුම්පත් වාර්තාව සංස්කරණය කිරීමේ කටයුතු සිදු කරන ලදී.

2014.12.31 දිනට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු පහත පරිදිවේ.

තනතුර	අනුමත කාර්ය මණ්ඩලය	දැනට සිටින කාර්ය මණ්ඩලය	පුරප්පාඩු
ලේකම්	1	1	_
ජ්‍යෙෂ්ඨ ප්‍රතිපත්ති පර්යේෂණ නිලධාරී	3	1	2
නියෝජ්‍ය ලේකම් / සහකාර ලේකම්	1	1	_
ප්‍රතිපත්ති පර්යේෂණ නිලධාරී	4	4	_
පරිපාලන නිලධාරී	1	1	_
වැඩසටහන් නිලධාරී (මුදල්)	1	1	_
වැඩසටහන් නිලධාරී (ප්‍රතිපත්ති/සැලසුම්)	4	2	2
වැඩසටහන් නිලධාරී (තොරතුරු)	1	_	1
කළමනාකරණ සහකාර	10	9	1
රියදුරු	6	6	_
ආරක්ෂක නියාමක	2	2	_
කාර්යාල සහයක	4	4	_
මුළු	**38**	**32**	**6**

මානව සම්පත් සංවර්ධනය

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලය මේවන විට 32 දෙදෙකුට සීමා වී ඇත. ප්‍රතිපත්ති සම්පාදනය සඳහා පර්යේෂණ හා සමීක්ෂණ අනිවාර්ය සහ අත්‍යවශ්‍ය වන බැවින් එම කාර්යයන් සඳහා නිපුණත්වයෙන් යුත් කාර්ය මණ්ඩලයක් සිටීම වැදගත් වේ.

ඒ අනුව, ජාතික අධ්‍යාපන ප්‍රතිපත්ති සකස් කිරීම සම්බන්ධයෙන් පුළුල් කාර්යභාරයක් ඉටුකරනු ලබන ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ කාර්ය මණ්ඩලයේ දැනුම යාවත්කාලීන කිරීම මෙන්ම නිපුණතා වර්ධනය සඳහා පුහුණු වැඩසටහන් මෙන්ම ධාරිතා සංවර්ධන වැඩසටහන් සඳහා නිරන්තරයෙන් යොමුකිරීමේ අවශ්‍යතාව ආයතනය විසින් හඳුනාගෙන ඇත.

අයවැය ප්‍රතිපාදන හා මූල්‍ය ප්‍රගතිය - 2014

වැය විෂය අංකය	කාර්යය	වෙන්කළ මුදල (රු.)	වැය කළ මුදල (රු.)	ප්‍රතිශතය
	පුනරාවර්තන වියදම්	**31,584,000**	**28,887,336**	**91**
	වැටුප	**17,350,000**	**15,918,385**	**50**
1001	වැටුප් හා වේතන	11,475,000	10,201,553	89
1002	අතිකාල හා වෙනත් දීමනා	750,000	602,270	80
1003	වෙනත් දීමනා	5,125,000	5,114,562	100
	ගමන් වියදම්	**325,000**	**64,328**	**20**
1101	දේශීය	150,000	64,328	43
1102	විදේශීය	175,000		0
	සැපයීම්	**2,309,000**	**2,223,959**	**96**
1201	ලිපිද්‍රව්‍ය සහ කාර්යාලීය අවශ්‍යතා	350,000	348,571	100
1202	ඉන්ධන හා ළිහිසි තෙල්	1,800,000	1,721,149	96
1203	නිල ඇඳුම්	91,000	88,889	98
1205	වෙනත් දීමනා	68,000	65,350	96
	නඩත්තු වියදම්	**2,450,000**	**2,118,692**	**86**
1301	වාහන	1,500,000	1,491,785	99
1302	යන්ත්‍ර සහ උපකරණ	800,000	563,651	70
1303	ගොඩනැගිලි	150,000	63,256	42
	ගිවිසුම්ගත සේවා	**9,150,000**	**8,561,972**	**94**
1402	තැපැල් හා සන්නිවේදන	1,000,000	750,358	75
1403	විදුලිය හා ජලය	1,000,000	973,003	97
1404	බදු කුලිය	5,400,000	5,140,800	95
1409	වෙනත්	1,750,000	1,697,811	97
	මාරුකිරීම්			
	මූලධන වියදම්	**5,450,000**	**3,966,258**	**73**
	මූලධන වත්කම්වල පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම	**150,000**	**0**	**0**
2002	යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ	150,000	0	**0**
	මූලධන වත්කම් අත්පත් කරගැනීම	**1,000,000**	**997,458**	**100**
2102	ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ	500,000	499,506	**100**
2103	යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ	500,000	497,952	**100**
	ධාරිතා සංවර්ධනය	**800,000**	**596,188**	**75**
2401	පුහුණුව හා සංවර්ධනය	800,000	596,188	75
	වෙනත් මූලධන වියදම්	**3,500,000**	**2,372,612**	**68**
2502	අධ්‍යාපන අංශය සඳහා ප්‍රතිපත්ති යෝජනා	3,500,000	2,372,612	68
	එකතුව	**37,034,000**	**32,853,594**	**89**

ඇමුණුම I

ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම - 2014

කේතය	විස්තරය	ප්‍රමාණය	මිල (රු.)
AC	වායු සමීකරණ යන්ත්‍ර	3	285,600.00
IMMP	මල්ටි මීඩියා ප්‍රොජෙක්ටර්	1	212,352.00
HEL	හිස් වැසුම (Helmet)	1	2,650.00
C19	විධායක පුටු - මධ්‍යම	3	21,262.50
STL	ලොකු කටු ඇමුණුම් යන්ත්‍ර	1	1,915.20
UPS-BA	යූ.පී.එස්. බැටරි	10	19,100.00
COM	පරිගනක යන්ත්‍ර	2	210,000.00
COMM	පරිගනක මොනිටර්	2	24,690.00
PHAR	ඖෂධ තැටි (තැනින් තැන ගෙන යා හැකි)	1	9,000.00
UPS	යූ.පී.එස්.	4	18,184.00
FC	ලිපිගොනු කැබිනට් - වානේ	7	103,155.00
TU	කුඩා මේස	3	26,544.00
PF	හිටුවන විදුලි පංකා	4	19,996.00
CALS	ගනක යන්ත්‍ර	7	8,274.00
VR	හඬ පටිගත කිරීමේ යන්ත්‍ර	2	17,000.00
DT	ඩේටා ට්‍රැවලර්	14	16,350.00
COM-KB	පරිගනක යතුරු පුවරු	2	1,385.00
එකතුව			**997,457.70**

ඇමුණුම II

විසර්ජන ගිණුම 2014

ඩී.ජී.එස්.ඒ - 1

විසර්ජන ගිණුම 2014

වියදම් ශීර්ෂ අංකය: 12 අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව

වාර්ෂික ඇස්තමේන්තුවෙහි සඳහන් පරිදි වැඩසටහන් අංකය	වාර්ෂික ඇස්තමේන්තුවෙහි සඳහන් පරිදි වැඩසටහනෙහි නම	(1) අයවැය ඇස්තමේන්තු වෙන් කිරීම	(2) පරිපූරක ප්‍රතිපාදන හා පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම	(3) මු.රෙ. 66 සහ මු.රෙ. 69 අනුව මාරු කිරීම	(4) මුළු ශුද්ධ වෙන් කිරීම (1+2+3)	(5) මුළු වියදම	(6) ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය/ ඉක්මීම (4-5)	පිටු අංකය (අදාළ ඩී.ජී.එස්.ඒ 2 ආකෘතියට අනුව)
		රු.	රු.	රු.	රු.	රු.	රු.	
1	පුනරාවර්තන	31,584,000	-	25,000 -25,000	31,584,000	28,887,337	2,696,663	3
	උප එකතුව (පුනරාවර්තන)	31,584,000	-	-	31,584,000	28,887,337	2,696,663	
1	මූලධන	5,450,000			5,450,000	3,966,258	1,483,742	4
	උප එකතුව (මූලධන)	5,450,000	-	-	5,450,000	3,966,258	1,483,742	
	මුළු එකතුව	37,034,000	-	-	37,034,000	32,853,595	4,180,405	

පිටු අංක 2 සිට 15 දක්වා ඩී.ජී.එස්.ඒ 2 සිට ඩී.ජී.එස්.ඒ 10 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් අංක 16 සිට 20 දක්වා ඇතුළත් අනෙකුත් විස්තර ද මෙම විසර්ජන ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. එබැවින් ඉහත ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඒට අදාළ ගිණුම් තොරතුරු හා සටහන්වලට අනුකූලව පිළියෙල කර ඇති බවත්, භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ අදාළ ගිණුම් සැසඳීම් කර ඇති බවත්, ඒවා නිවැරදි බවට තහවුරු වී ඇති බවත් මෙයින් සහතික කරමි.

ප්‍රධාන ගණන්දීමේ නිලධාරි
නම : මහාචාර්ය ලක්ෂ්මන් ජයතිලක
තනතුර : සභාපති, ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව, 126, නාවල පාර, නුගේගොඩ.
දිනය : 31-03-015

ගණන්දීමේ නිලධාරි
නම :
තනතුර : එච්. නිලක්ෂි එන්. ගුණසේකර, ලේකම්, ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව, අංක. 126, නාවල පාර, නුගේගොඩ.
දිනය :

ප්‍රධාන ගණකාධිකාරී/ අධ්‍යක්ෂ(මුදල්)/කොමසාරිස් (මුදල්)
නම :
දිනය : 31.03.15
S. M. Ariyarathna De Alwis
Deputy Secretary
National Education Commission
126, Nawala Road, Nugegoda.

ඇමුණුම III

කොමිෂන් සභාවේ සාමාජිකයින්ගේ තොරතුරු

හයවන කොමිෂන් සභාව ස්වකීය ප්‍රථම කොමිෂන් සභා රැස්වීම 2012 නොවැම්බර් 20 දින පවත්වමින් තම නිල කටයුතු ආරම්භ කරන ලදී.

එහි සාමාජිකත්වය :

සභාපති : මහාචාර්ය ලක්ෂ්මන් ජයතිලක මහතා

උප සභාපති : ආචාර්ය ජයන්ති ගුණසේකර මිය

නිල බලයෙන් පත්වන සාමාජිකයින් :

සභාපති, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව	මහාචාර්ය ක්ෂණිකා හිරිඹුරේගම මිය
සභාපති, තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව	මහාචාර්ය දයන්ත විජේසේකර මහතා ආචාර්ය චන්ද්‍රා ඇඹුල්දෙණිය මහතා 2014. 06. 19 සිට
අධ්‍යාපන අමාත්‍යාංශයේ නියෝජිත (ලේකම්)	අනුර දිසානායක මහතා
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ නියෝජිත (අධ්‍යක්ෂ, ජාතික අයවැය දෙපාර්තමේන්තුව)	අයන්ති ද සිල්වා මිය
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ නියෝජිත (ලේකම්)	ආර්.ඒ.ඒ.කේ. රණවක මහතා

පත්කරන ලද සාමාජිකයින් :

පූජ්‍ය මහාචාර්ය බෙල්ලන්විල විමලරතන ස්වාමීන්වහන්සේ

ආචාර්ය සුනිල් ජයන්ත නවරත්න මහතා

ආරියරත්න හේවගේ මහතා

පුෂ්පා කළුබෝවිල මිය

මහාචාර්ය ජයසේන කෝට්ටේගොඩ මහතා

මහාචාර්ය එස්. සන්දසේගරම් මහතා

ආචාර්ය හිරන්ති විජේමාන්න මිය

අනෝජා විජේසේකර මිය 2014. 03. 22 දක්වා

මහාචාර්ය දයන්ත විජේසේකර මහතා 2014. 08.14 සිට

ලේකම්

පී.ජී.ඩී. ප්‍රදීපා සේරසිංහ මිය

ඇමුණුම IV

විගණකාධිපති වාර්තාව - 2014

ශීර්ෂය 1 සිට 22 දක්වා - විශේෂ වියදම් ඒකක පිළිබඳ විගණකාධිපති වාර්තාව 2014 වර්ෂය

මෙම වාර්තාවේ 1 ඡේදයෙහි හා 2 ඡේදයෙහි 1 සිට 22 දක්වා වූ ශීර්ෂවලට අදාල කාර්යාලවල, කොමිෂන් සභාවල හා දෙපාර්තමේන්තුවල ගිණුම් පිළිබඳ පොදු තොරතුරු ඇතුළත් කර ඇති අතර 3 ඡේදයේ සිට එක් එක් ශීර්ෂයට අදාළ විගණන නිරීක්ෂණ දැක්වේ.

1. **විශේෂ වියදම් ඒකකයට අදාල ශීර්ෂ හා කාර්යාල, කොමිෂන් සභා හා දෙපාර්තමේන්තු**

ශීර්ෂය	කාර්යාලය, කොමිෂන් සභාව, දෙපාර්තමේන්තුවේ නම
1	අතිගරු ජනාධිපතිතුමා
2	අග්‍රාමාත්‍ය කාර්යාලය
3	විශේෂ කාර්යයන් පිළිබඳ ලේකම් කාර්යාලය (ජ්‍යෙෂ්ඨ අමාත්‍යවරු)
4	උපරිමාධිකරණවල විනිශ්චයකාරවරු
5	අමාත්‍ය මණ්ඩල කාර්යාලය
6	රාජ්‍ය සේවා කොමිෂන් සභාව
7	අධිකරණ සේවා කොමිෂන් සභාව
8	ජාතික පොලිස් කොමිෂන් සභාව
9	පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය
10	අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව
11	මුදල් කොමිෂන් සභා කාර්යාලය
12	ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව
13	ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
14	නීතිපති දෙපාර්තමේන්තුව
15	නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව
16	පාර්ලිමේන්තුව
17	පාර්ලිමේන්තුවේ සභානායකතුමාගේ කාර්යාලය
18	පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාගේ කාර්යාලය
19	පාර්ලිමේන්තුවේ විපක්ෂ නායකතුමාගේ කාර්යාලය
20	මැතිවරණ දෙපාර්තමේන්තුව
21	විගණකාධිපති
22	පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්තුමාගේ කාර්යාලය

2

1.1 විගණන විෂය පථය

ඉහත 1 ඡේදයේ සඳහන් විශේෂ වියදම් ඒකකවලට අදාල කාර්යාවල, කොමිෂන් සභාවල හා දෙපාර්තමේන්තුවල 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම්, ආදායම් ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තා පහත සඳහන් දිනවල එම කාර්යාලවල, කොමිෂන් සභාවල හා දෙපාර්තමේන්තුවල ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වි ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

ශීර්ෂය	අමාත්‍යාංශයසභාව/කාර්යාලය/දෙපාර්තමේන්තුව /	කළමනාකරණ විගණන වාර්තාව නිකුත් කළ දිනය
1	අතිගරු ජනාධිපතිතුමා	2015.09.15
2	අග්‍රාමාත්‍ය කාර්යාලය	2015.08.21
3	විශේෂ කාර්යයන් පිළිබඳ ලේකම් කාර්යාලය (ජ්‍යෙෂ්ඨ අමාත්‍යවරු)	2019.06.09
4	උපරිමාධිකරණවල විනිශ්චයකාරවරු	2015.09.07
5	අමාත්‍ය මණ්ඩල කාර්යාලය	2015.05.27
6	රාජ්‍ය සේවා කොමිෂන් සභාව	2015.07.14
7	අධිකරණ සේවා කොමිෂන් සභාව	2015.06.19
8	ජාතික පොලිස් කොමිෂන් සභාව	2015.05.11
9	පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය	2015.07.08
10	අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව	2015.07.08
11	මුදල් කොමිෂන් සභා කාර්යාලය	2015.08.12
12	ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව	2015.06.12
13	ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව	
14	නීතිපති දෙපාර්තමේන්තුව	2015.09.18
15	නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව	2015.09.18
16	පාර්ලිමේන්තුව	2015.06.16
17	පාර්ලිමේන්තුවේ සභානායකතුමාගේ කාර්යාලය	2015.05.25
18	පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාගේ කාර්යාලය	2015.05.27
19	පාර්ලිමේන්තුවේ විපක්ෂ නායකතුමාගේ කාර්යාලය	2015.06.03
20	මැතිවරණ දෙපාර්තමේන්තුව	2015.08.20
21	විගණකාධිපති	

3

22	පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්තුමාගේ කාර්යාලය	2015.05.21

1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන්ගේ වගකීම

විසර්ජන ගිණුම්, අදායම් ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන්ගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරිම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

2. ගිණුම්

2.1 විසර්ජන ගිණුම

(අ) මුළු ප්‍රතිපාදනය හා වියදම

කාර්යාල, කොමිෂන් සභා හා දෙපාර්තමේන්තු 22 ක් සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 18,461 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 17,181 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව කාර්යාලවල, කොමිෂන් සභාවල හා දෙපාර්තමේන්තුවල ශුද්ධ ප්‍රතිපාදනයන්ගෙන් ඉතිරිවීම් රු.මිලියන 0.54 ක සිට රු.මිලියන 642.3 ක දක්වා පරාසයක ප්‍රමාණයකින් හෙවත් මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 0.0029 ක සිට සියයට 3.48 ත් අතර පරාසයක පැවැතුණි. විස්තර පහත දැක්වේ.

4

ශීර්ෂය	කාර්යාලය/ කොමිෂන් සභාව/ දෙපාර්තමේන්තුව	2014 දෙසැම්බර් 31 දිනට ශුද්ධ ප්‍රතිපාදනය	උපයෝජනය	ඉතිරිය	ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස
		රු.මිලියන	රු.මිලියන	රු.මිලියන	
1	අතිගරු ජනාධිපතිතුමා	10,518	9,876	642	6.10
2	අග්‍රාමාත්‍ය කාර්යාලය	335	321	14	4.18
3	විශේෂ කාර්යයන් පිළිබඳ ලේකම් කාර්යාලය ජොෂ්ඨ) (අමාත්‍යවරු	533	440	93	17.45
4	උපරිමාධිකරණවල විනිශ්චයකාරවරු	365	159	206	56.44
5	අමාත්‍ය මණ්ඩල කාර්යාලය	73	58	15	20.55
6	රාජ්‍ය සේවා කොමිෂන් සභාව	245	230	15	6.12
7	අධිකරණ සේවා කොමිෂන් සභාව	39	35	4	10.26
8	ජාතික පොලිස් කොමිෂන් සභාව	45	43	2	4.44
9	පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය	18	15	3	16.67
10	අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව	201	196	5	2.49
11	මුදල් කොමිෂන් සභා කාර්යාලය	41	35	6	14.63
12	ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව	37	33	4	10.81
13	ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව	191	154	37	19.37
14	නීතිපති දෙපාර්තමේන්තුව	535	534	1	0.19
15	නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව	112	76	36	32.14
16	පාර්ලිමේන්තුව	1,729	1,647	82	4.74
17	පාර්ලිමේන්තුවේ සභානායකතුමාගේ කාර්යාලය	29	27	2	6.90
18	පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාගේ කාර්යාලය	49	36	13	26.53

5

19	පාර්ලිමේන්තුවේ විපක්ෂ නායකතුමාගේ කාර්යාලය	118	111	7	5.93
20	මැතිවරණ දෙපාර්තමේන්තුව	2,194	2,179	15	0.68
21	විගණකාධිපති	1,042	967	75	7.20
22	පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්තුමාගේ කාර්යාලය	11	9	2	18.18
		---------	---------	--------	
	එකතුව	**18,460**	**17,181**	**1,279**	**8.47**
		======	======	=====	

2.2 ආදායම් ගිණුම

ඇස්තමේන්තගත හා තථ්‍ය ආදායම

දෙපාර්තමේන්තු දෙකක් විසින් 2014 වර්ෂය සඳහා ආදායම් සංකේත දෙකක් සඳහා එකතුව රු.මිලියන 133 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.මිලියන 136.54 ක ආදායමක් රැස්කර තිබුණි. ඒ අනුව ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 102.66 ක ආදායමක් රැස්කර තිබුණි විස්තර පහත දැක්වේ.

ආදායම් සංකේතය	2014 දෙසැම්බර් 31 දිනට			ඉක්මවීම ඇස්තමේන්තුවේ ප්‍රතිශතයක් ලෙස
	ඇස්තමේන්තුගත ආදායම	තථ්‍ය ආදායම	ඉක්මවීම	
	රු.මිලියන	රු.මිලියන	රු.මිලියන	
20.03.02.01	98.00	100.47	2.47	2.45
20.03.02.11	35.00	36.07	1.07	3.06
	---------	---------	-------	
එකතුව	**133.00**	**136.54**	**3.54**	**2.66**
	====	====	===	

2.3 අත්තිකාරම් ගිණුම්

2.3.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්

කාර්යාල, කොමිෂන් සභා හා දෙපාර්තමේන්තු 22 ක් වෙත රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් එම ආයතන විසින් පිළිපැද තිබුණි. විස්තර පහත දැක්වේ.

ශීර්ෂය	විෂය අංකය	වියදම		ලැබීම්		හර ශේෂය	
		උපරිම සීමාව	තථ්‍ය	අවම සීමාව	තථ්‍ය	උපරිම සීමාව	තථ්‍ය
		රු.	රු.	රු.	රු.	රු.	රු.
1	00101	20,000,000	19,907,822	14,000,000	20,976,552	100,000,000	76,098,838
2	00201	5,500,000	3,751,041	3,000,000	3,742,317	27,000,000	20,839,140
3	00301	3,100,000	3,009,212	1,100,000	2,034,947	12,000,000	7,972,027
4	00401	3,000,000	15,000	1,000,000	1,079,485	38,000,000	1,293,811
5	00501	2,600,000	1,262,957	2,000,000	2,428,420	13,000,000	9,747,869
6	00601	6,500,000	6,390,934	3,000,000	4,873,498	32,000,000	22,8887,663
7	00701	3,000,000	2,576,926	1,200,000	1,907,606	20,000,000	8,758,115
8	00801	1,800,000	1,586,334	1,100,000	1,499,694	12,000,000	3,924,086
9	00901	1,000,000	607,585	270,000	541,158	2,000,000	1,591,185
10	01001	5,000,000	2,841,981	3,000,000	4,053,906	25,000,000	14,955,210
11	01101	3,000,000	1,635,273	1,000,000	1,390,742	12,000,000	7,399,519
12	01201	1,500,000	727,214	600,000	832,722	6,000,000	2,542,827
14	01401	23,000,000	10,723,994	12,000,000	14,866,003	90,000,00	46,358,905
15	01501	4,000,000	2,017,965	2,000,000	2,730,296	23,000,000	11,820,060
16	01601	38,000,000	26,591,486	22,000,000	27,848,311	175,000,000	134,886,229
17	01701	2,000,000	1,489,347	800,000	1,267,080	3,500,000	2,974,562
18	01801	1,500,000	1,490,100	1,000,000	1,334,236	6,500,000	4,679,454
19	01901	2,000,000	1,349,458	1,000,000	1,641,570	9,000,000	4,232,573
20	02001	22,000,000	8,845,500	13,000,000	13,439,862	80,000,000	58,197,555
21	02101	50,000,000	31,447,335	42,000,000	49,464,978	295,000,000	233,587,596
22	02201	1,000,000	385,388	250,000	417,024	3,500,000	1,603,048

7

2.4 අග්‍රිම ගිණුම්

කාර්යාල, කොමිෂන් සභා හා දෙපාර්තමේන්තු 20 කට අදාළ අග්‍රිම ගිණුම්වල 2014 දෙසැම්බර් 31 දින වන විට රු.154,788,902 ක ශේෂයක් විය. විස්තර පහත දැක්වේ.

ශීර්ෂය	දෙපාර්තමේන්තුව/ කාර්යාලය/ කොමිෂන් සභාව	අග්‍රිම ගිණුම් අංකය	2014 දෙසැම්බර් 31 දිනට ශේෂය හර/(බැර)
-------	----------------------------------	--------------------------	--------------------------
			රු.
1	අතිගරු ජනාධිපතිතුමා	7002/0000/00/0117/0014	48,443,261
2	අග්‍රාමාත්‍ය කාර්යාලය	7002/0000/00/0118/0014	5,950,366
4	උපරිමාධිකරණවල විනිශ්චයකාරවරු	7002/0000/00/0390/0014	3,624,904
5	අමාත්‍ය මණ්ඩල කාර්යාලය	7002/0000/00/0119/0014	250
6	රාජ්‍ය සේවා කොමිෂන් සභාව	7002/0000/00/0297/0014	7,428,360
7	අධිකරණ සේවා කොමිෂන් සභාව	7002/0000/00/0122/0014	2,663,565
8	ජාතික පොලිස් කොමිෂන් සභාව	7002/0000/00/0365/0014	859,619
9	පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරය	7002/0000/00/0366/0014	123,569
10	අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව	7002/0000/00/0139/0014	776,317
11	මුදල් කොමිෂන් සභා කාර්යාලය	7002/0000/00/0279/0014	7,052,973
12	ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව	7002/0000/00/0256/0014	12,385
14	නීතිපති දෙපාර්තමේන්තුව	7002/0000/00/0137/0014	5,014,390
15	නීති කෙටුම්පත් සම්පාදන දෙපාර්තමේන්තුව	7002/0000/00/0138/0014	1,335,628
16	පාර්ලිමේන්තුව	7002/0000/00/0120/0014	4,355,316
17	පාර්ලිමේන්තුවේ සභානායකතුමාගේ කාර්යාලය	7002/0000/00/0275/0014	185,818
18	පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාගේ කාර්යාලය	7002/0000/00/0276/0014	514,744
19	පාර්ලිමේන්තුවේ විපක්ෂ නායකතුමාගේ කාරියාලය	7002/0000/00/0277/0014	663,515
20	මැතිවරණ දෙපාර්තමේන්තුව	7002/0000/00/0121/0014	65,740,391
21	විගණකාධිපති	7002/0000/00/0001/0014	49
22	පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්තුමාගේ කාර්යාලය	7002/0000/00/0278/0014	43,482

	එකතුව		**154,788,902**
			========

2.5 පොදු තැන්පත් ගිණුම්

2014 දෙසැම්බර් 31 දිනට කාර්යාල, කොමිෂන් සභා හා දෙපාර්තමේන්තු 22 ක් අතුරින් ආයතන 16 ක පොදු තැන්පත් ගිණුම්වල ශේෂවල එකතුව රු. 759,478,446 ක් වූ අතර ඒ පිළිබඳ විස්තර පහත දැක්වේ.

ශීර්ෂය	දෙපාර්තමේන්තුව/ කාර්යාලය/ කොමිෂන් සභාව	ගිණුම් අංකය	2014 දෙසැම්බර් 31 දිනට ශේෂය හර/(බැර)
			රු.
1	අතිගරු ජනාධිපතිතුමා	6000/0000/00/0006/0077	292,333,243
		6000/0000/00/0015/0001	445,943,624
2	අග්‍රාමාත්‍ය කාර්යාලය	6000/0000/00/0015/0002	576,939
3	විශේෂ කාර්යයන් පිළිබඳ ලේකම් කාර්යාලය (ජ්‍යෙෂ්ඨ අමාත්‍යවරු)	6000,0000,00,0015,0190	477,711
5	අමාත්‍ය මණ්ඩල කාර්යාලය	6000/0000/00/0015/0003	74,097
6	රාජ්‍ය සේවා කොමිෂන් සභාව	6000/0000/00/0015/0008	2,321,609
7	අධිකරණ සේවා කොමිෂන් සභාව	6000/0000/00/0002/0032	4,175
8	ජාතික පොලිස් කොමිෂන් සභාව	6000/0000/00/0015/0009	(23,075)
10	අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව	6000/0000/00/0015/0010	199,726
11	මුදල් කොමිෂන් සභා කාර්යාලය	6000/0000/00/0015/0013	79,500
12	ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව	6000/0000/00/0015/0014	30,000
13	ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව	6000/0000/00/0015/0017	(10,366,732)
14	නීතිපති දෙපාර්තමේන්තුව	6000/0000/00/0015/0110	1,431,395
15	නීති කෙටුම්පත් සම්පාදන දෙපාර්තමේන්තුව	6000/0000/00/0015/0111	265,475
16	පාර්ලිමේන්තුව	6000/0000/00/0015/0004	2,117,184
20	මැතිවරණ දෙපාර්තමේන්තුව	6000/0000/00/0015/0011	5,793,023
21	විගණකාධිපති	6000/0000/00/0015/0012	18,220,552
	එකතුව		**759,478,446**

2.6 විගණන නිරීක්ෂණය

2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව කාර්යාලවල, කොමිෂන් සභාවල හා දෙපාර්තමේන්තුවල විසර්ජන ගිණුම්, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවල සඳහන් නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවල ඇතුළත් නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සිට 24 ඡේදය දක්වා වූ ඡේදවල සඳහන් කර ඇත.

3. ශීර්ෂය 1 – අතිගරු ජනාධිපතිතුමා

3.1 විගණන සාක්ෂි නොවීම

පහත සඳහන් ගනුදෙනු සම්බන්ධයෙන් ඒවාට ඉදිරියෙන් සඳහන් කර ඇති විගණන සාක්ෂි ඉදිරිපත් නොවූ බැවින් විගණනයේදී එම ගනුදෙනු සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

ගනුදෙනුව	වටිනාකම	ඉදිරිපත් නොවූ සාක්ෂි
	රු.	
ශ්‍රව්‍ය දෘෂ්‍ය උපකරණ සඳහා කුලී	61,353,428	ජනාධිපති ලේකම් කාර්යාලයට අයත් මාධ්‍ය උපකරණ වෙනත් මාධ්‍ය ප්‍රචාරක කාර්යයන්හි යොදවා ඇද්ද යන්න පිළිබඳව විමසීම් කරන ලද ලිපිවල පිටපත්
ලිබඩු සහ කැනපි කුලියට ගැනීම	30,866,510	අදාල අවශ්‍යතාවය සහ අවශ්‍ය ප්‍රමාණය පිළිබඳ දළ ඇස්තමේන්තු
තෙවන පාර්ශවයක් වෙත ලබාදුන් කාර්යයන්	32,781,120	ඔවුන් සමඟ ඇතිකර ගත් ගිවිසුම්වල පිටපත්
එකතුව	**125,001,058**	

(iii) ද්විතියික මට්ටම	44	24	20
(iv) ප්‍රාථමික මට්ටම	13	09	04
	----	-----	----
එකතුව	76	42	34
	===	===	===

14. ශීර්ෂය 12 - ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව

14.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පහත දැක්වෙන ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබු බැව් නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

ලේඛන වර්ගය	අදාළ රෙගුලාසිය	නිරීක්ෂණ
(අ) ස්ථාවර වත්කම් ලේඛනය	දිනැති 19 දෙසැම්බර් 1978 දරන භාණ්ඩාගාර 842 අංක චක්‍රලේඛය	වර්ෂයට පෙර 2006 අත්පත් කරගත් වත්කම් ස්ථාවර වත්කම් ඇතුළත් කර ලේඛනයට .නොතිබුණි
(ආ) පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය	28 නොවැම්බර් 2002 දිනැති අංක 02/2002/අයිඒඅයිදරන භාණ්ඩාගාර චක්‍රලේඛය	පවත්වා නොතිබුණි.
(ඇ) ඇප ලේඛනය	මුදල් රෙගුලාසි (1)891	පවත්වා නොතිබුණි.

14.2 විසර්ජන ගිණුම

අයවැය විචලනය

වැය විෂයයන් 02 ක් සඳහා සළසා තිබුණු රු.325,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබු අතර වැය විෂයයන් 08 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය

කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 11 ත් සියයට 58 ත් දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

14.3 අග්‍රිම ගිණුම

කොමිෂන් සභාවේ රැස්වීම් හා වැඩමුළු ආදිය සඳහා සමාලෝචිත වර්ෂයේදී අවස්ථා 31 කදී රු.1,103,615 ක් වූ අත්තිකාරම් නිකුත් කර තිබුණු අතර ඉන් රු.582,467 ක් හෙවත් සියයට 52 ක් වැය නොකර නැවත මුදලින් පියවා තිබුණි. එසේම කළ යුතු නිශ්චිත වියදම හඳුනානොගෙන වැඩසටහන් වියදම් පියවා ගැනීම පිණිස නිලධාරීන් 06 දෙනෙකු වෙත භාණ්ඩාගාර අනුමැතියකින් තොරව රු.75,000 බැගින් එකතුව රු.450,000 ක අත්තිකාරම් නිකුත් කර තිබුණි.

14.4 යහපාලනය සහ ගිණුම් කටයුතුභාවය

14.4.1 වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව කොමිෂන් සභාවේ වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම තුළට යාවත්කාලීන කළ ආයතනයේ සංවිධාන ව්‍යුහය , කාර්ය මණ්ඩල විස්තර සහ අක්මුදල් අවශ්‍යතා සැලැස්ම ඇතුළත් කර නොතිබූ අතර 2014 ඔක්තෝබර් 30 දින සංශෝධනය කරන ලද එම සැලැස්ම කොමිෂන් සභාව විසින් අනුමත කර නොතිබුණි.

14.4.2 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම කොමිෂන් සභාව විසින් අනුමත කර නොතිබූ අතර එම සැලැස්මේ ඇතුළත් නොවූ රු.302,600 ක් වටිනා කාර්යාල යන්ත්‍ර උපකරණ ඒකක 05 ක් මිලදී ගෙන තිබුණි.

14.4.3 අභ්‍යන්තර විගණනය

ආරම්භයේ සිට 2015 ජුනි 25 දින වන විටත් අභ්‍යන්තර විගණනයක් ක්‍රියාත්මක කර නොතිබුණි.

14.5 අනුකූල නොවීම්

(අ) නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

නීති රීති හා රෙගුලාසිවලට යොමුව	වටිනාකම	අනුකූල නොවීම
	රු.	
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය		
(i) මුදල් රෙගුලාසි (2)262	768,709	ගෙවීම් වවුචර් ක උපයෝගි 28 ලියවිලිවල"ගෙවන ලදි " මුද්‍රාව තබා නොතිබුණිමේ නිසා වරක් ගෙවීම් කළ . ලියවිලි නැවත ගෙවීමේ අවධානමක් .පවතින බව නිරීක්ෂණය විය
(ii) මුදල් රෙගුලාසි (1)261	296,205	අවස්ථා කදී මුදල් පොතේ අනුක්‍රමික 11 අංක පිළිවෙලට වවුචර් අංක සටහන් අනුක්‍රමික අංක කර නොතිබූ අතර පිළිවෙලට ඇති අවස්ථාවල චෙක්පත් අංක අනුපිළිවෙළට නොමැති අවස්ථා .නිරීක්ෂණය විය

(ආ) බදු අවශ්‍යතාවයන්ට අනුකූල නොවීම

2002 සැප්තැම්බර් 30 දිනැති අංක 364(3) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 5 ඡේදය පරිදි රාජ්‍ය ආයතන විසින් ගෙවනු ලබන රු.25,000 ඉක්මවන එකතු කළ අගය මත බදු සම්බන්ධයෙන් ඊළඟ මාසයේ 15 වෙනි දිනට පෙර විගණකාධිපතිට පිටපත් සහිතව දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත වාර්තා යැවිය යුතු වුවත්, කොමිෂන් සභාවේ රු.5,140,800 ක් වූ ගොඩනැඟිලි බදු කුළී සඳහා ගෙවූ රු.550,800 ක් වූ එකතු කළ අගය මත බදු පිළිබඳ වාර්තා යවා නොතිබුණි.

14.6 කාර්යසාධනය

2014 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව කොමිෂන් සභාවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත

ප්‍රමාණවත් ලෙස ඉටුනොකළ කාර්යයන්

කොමිෂන් සභාව විසින් ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ ප්‍රධාන කාර්යයන් පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) සාමාන්‍ය අධ්‍යාපනය පිළිබඳ ප්‍රතිපත්ති යෝජනා සකස් කර කොමිෂන් සභාවේ අනුමැතිය ලබාගෙන මුද්‍රණය කිරීම.

(ආ) තුන්වන වර්ගයේ පාසැල් සඳහා දත්ත පාදයක් සකස් කිරීම යටතේ පළාත්වලින් රැස්කර ගන්නා දත්ත ආශ්‍රයෙන් නිර්ණායක සකස් කිරීම.

(ඇ) අ.පො.ස.(උ.පෙළ) තාක්ෂණ විෂය ධාරාව ක්‍රියාත්මක කිරීම පිළිබඳ පර්යේෂණයේ අවසන් වාර්තාව සකස් කිරීම.

(ඈ) ජාතික අධ්‍යාපන විද්‍යා පීඨ වලට ගුරු සිසුන් බඳවා ගැනීමේ ප්‍රතිපත්තිය සහ එහිදි සළකා බැලෙන නිර්ණායක පිළිබඳ දත්ත රැස්කර , විශ්ලේෂණය කර වාර්තාව සකස් කිරීම.

(ඉ) සිංහල භාෂාව භාවිතය හා ප්‍රමිතිකරණය යටතේ කෙටුම්පත් වාර්තාව සංස්කරණය කර අවසන් වාර්තාව සකස් කිරිම.

(ඊ) විශ්වවිද්‍යාල අධ්‍යාපනය සඳහා ප්‍රතිපත්ති මාලාවක් සකස් කිරීම යටතේ ක්ෂේත්‍ර සමාලෝචනයන් ආශ්‍රයෙන් තොරතුරු රැස් කර දත්ත විශ්ලේෂණය කර වාර්තාව සකස් කිරීම.

(උ) කාර්ය මණ්ඩල පුද්ගලික දත්ත එකතු කර කාර්ය මණ්ඩල සැලැස්මක් සකස් කිරීම.

14.7 අවිධිමත් ගනුදෙනු

වායුසමන යන්ත්‍ර 03 ක් එකක් රු.95,200 බැගින් රු.285,600 කට මිලදි ගෙන තිබුණි. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.11.1 මාර්ගෝපදේශයෙන් බැහැරව තාක්ෂණික දැණුම ඇති නිලධාරියෙකු සහිත තාක්ෂණික අගැයීම් කමිටුවේ නිර්දේශයකින් තොරව හා අවම ලංසුකරුගේ මිල වූ රු.70,784 ක ලංසුව හේතු දැක්වීමකින් තොරව ප්‍රතික්ෂේප කර අටවන මිල ඉදිරිපත් කළ ලංසුකරුගෙන් මිලදී ගෙන තිබුණි. මේ නිසා යන්ත්‍ර 03 ක් වෙනුවෙන් රු.73,248 ක් වැඩිපුර ගෙවා තිබුණි.

14.8 අනාර්ථික ගනුදෙනු

නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ ආකාරයට ආයතනයේ මධ්‍යකාලීන සැලැසුම සකස් කිරීම සඳහා රු.320,650 ක වියදමකින් වැඩමුළු දෙකක් පවත්වා තිබුණද මධ්‍යකාලීන සැලැසුම සකස් කිරීමට නොහැකි වී තිබූ අතර "ආයතනය තුළින් සපයාගත නොහැකි කෙටිකාලීන හදිසි සේවාවන් සපයා ගැනීම" සඳහා වන 2014 පෙබරවාරි 21 දිනැති අංක 449 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය අනුචිත ආකාරයට යොදා ගනිමින් එහි එක්දින වැඩමුළුවක සම්පත් දායක දීමනා ලෙස එක් පුද්ගලයෙකුට රු.30,000 ක් ගෙවා තිබුණි.

14.9 කළමනාකරණ දුර්වලතා

නියැදි විගණන පරීක්ෂණ වලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) පුස්තකාලයේ කාර්යයන් සඳහා වගකිව යුතු නිලධාරියෙකු ස්ථිර ලෙස පත් නොකිරීම, පුස්තකාල පොත් සම්බන්ධයෙන් භෞතික තොග සමීක්ෂණයක් ආරම්භයේ සිටම සිදුකර නොතිබීම, පුස්තකාලයෙන් බැහැර ගෙනයන පොත් ආපසු භාර නොදීම හා භාරදීමට බොහෝ කල්ගතවීම සහ විශ්‍රාම ගිය හා ස්ථාන මාරු වී ගිය නිලධාරීන් දෙදෙනෙකු ඇතුළුව තුන්දෙනෙකු විසින් රැගෙන ගිය පුස්තකාල පොත් 04 ක්, මාස 10 සිට වසර 04 දක්වා පරාසයක් ගතවී තිබුණත්, එම පොත් 2015 ජුනි 25 දින වන විටත් ආපසු භාර දී නොතිබුණි.

(ආ) ''විවිධ මූලාශ්‍රයන්ගෙන් ලබාගත් තොරතුරු රැස්කොට එම තොරතුරු විධිමත් ලෙස විශ්ලේෂණය කිරීමෙන් තීරණ ගැනීමේ පදනමක් ලෙස යොදා ගැනීම'' අරමුණු කරගෙන අධ්‍යාපන අංශ සංවර්ධන ව්‍යාපෘතියේ රු.938,600 ක මූල්‍යාධාර උපයෝගී කරගෙන 2010 වර්ෂයේ පිහිටුවන ලද දත්ත බැංකුවේ කාර්යයන් ඉටුකිරීමට අනුමත කාර්ය මණ්ඩලයේ ඇතුළත් වැඩසටහන් නිලධාරී (තොරතුරු) තනතුර සඳහා ස්ථිර නිලධාරියෙකු බඳවා ගැනීමට කටයුතු නොකර කෙටිකාලීන පුහුණුවන්නන්ගේ සේවය යොදා ගෙන තිබුණි.

14.10 මානව සම්පත් කළමනාකරණය

අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2014 දෙසැම්බර් 31 දිනට සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

	සේවක වර්ගය	අනුමත සේවක සංඛ්‍යාව	තථ්‍ය සේවක සංඛ්‍යාව	පුරප්පාඩු සංඛ්‍යාව
(i)	ජ්‍යෙෂ්ඨ මට්ටම	02	02	-
(ii)	තෘතීයික මට්ටම	06	06	-
(iii)	ද්විතීයික මට්ටම	16	12	04
(iv)	ප්‍රාථමික මට්ටම	12	12	-
		36	32	04

15. ශීර්ෂය 13 - ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

15.1 ලේඛන හා පොත් පත් පවත්වා නොතිබීම

කොමිෂන් සභාව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු බව නියැදි පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

ලේඛන වර්ගය	අදාල රෙගුලාසිය
ස්ථාවර වත්කම් ලේඛනය	1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය
හානි පිළිබඳ ලේඛනය	මුදල් රෙගුලාසි 110

15.2 විසර්ජන ගිණුම

ඇමුණුම V

ආයතනික ව්‍යුහය

Organizational Structure of National Education Commission